ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

නො.7, ග්‍රෙගරි මාවත ,කොළඹ 07
இல 7, கிரகரிஸ் வீதி, கொழும்பு 07
No.7 , Gregory's Avenue, Colombo 07

ෆැක්ස් / Fax : 694651
ඊමේල් / E-mail : Landcom@sltnet.lk


මගේ අංකය / MY NO : චක්‍රලේඛ අංකය:2005/2

ඔබේ අංකය / YOUR NO:

දිනය / DATE : 2005.01.25

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන්/ සහකාර ඉඩම් කොමසාරිස්වරුන් වෙත.

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ 20 'අ' අනුමැතිය සඳහා වාර්තා සැපයීම**

ඉහත කරුණ සම්බන්ධව මාගේ 1998.03.04 දිනැති 98/02 චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

අතිගරු ජනාධිපතිතුමිය විසින් ගරු කෘෂිකර්ම වාරිමාර්ග පශුසම්පත් හා ඉඩම් අමාත්‍යතුමා වෙත යවා ඇති 2004.12.07 දින ලිපියේ දී ඇති උපදෙස් අනුව ඉඩම් බැහැර කිරීමේදී විනිවිදභාවය ආරක්ෂා කර ගැනීම සඳහා ඉඩම් කච්චේරි අනිවාර්යෙන්ම පැවැත්වීම ගැන විශේෂ අවධානය යොමුකර ඇත. එහෙත් ඉඩම් සංවර්ධන ආඥා පනතේ 20 'අ' වගන්තිය යටතේ ඉඩම් බැහැර කිරීම සඳහා කටයුතු කිරීමේදී එම තෝරා ගැනීම පිළිබඳව ඉතා සීමිත පිරිසකගේ පමණක් අවධානය යොමුවේ. එමනිසා අනවසර නියමානුකූල කිරීම සඳහා ඉහත වගන්තිය යටතේ පැවරි ඇති බලතල ක්‍රියාත්මක කිරීමේදී යම් පුද්ගලයෙකු තෝරා ගැනීමේ ඇති විනිවිදභාවය පිළිබඳව සැක මතුවිය හැකි අවස්ථා දක්නට ලැබේ. මේනිසා ඉදිරියේදී අනවසර නියමානුකූල කිරීම යටතේ ඉ.සං.ආ.පනතේ 20 'අ' අනුමැතිය ලබා ගැනීමට වාර්තා ඉදිරිපත් කිරීමේදී පහළින් සඳහන් ක්‍රියාමාර්ග ගතයුතු බවට සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් නිකුත් කරන්න.

I. අනවසර නියමානුකූල කිරීම යටතේ තෝරා ගැනීමට ඉල්ලුම් කරන අය වසම් මට්ටමින් ඉ.කො.105 ආකෘතියට විස්තර ලබාගෙන ප්‍රසිද්ධ පරීක්ෂණයකට කැඳවීම හා සුදුසුකම් ප්‍රසිද්ධියේ පරීක්ෂා කිරීම.

II. එම ප්‍රසිද්ධ පරීක්ෂණයේදී තෝරාගත් පුද්ගලයින්ගේ නාම ලේඛන ප්‍රසිද්ධ කර විරෝධතා කැඳවීම.

1995.06.15 දිනට පෙර, අනවසර අල්ලා ගැනීම් සංඛ්‍යාව සඳහා පමණක් ඉ.සං.ආ.පනතේ 20 ' අ ' අනුමැතියට ඉදිරිපත් කල හැකි අතර, එම ප්‍රමාණය අවසන් වූ පසු කිසිදු අනවසර ඉඩමක් සඳහා ඉ.සං.ආ 20 ' අ ' අනුමැතියට ඉදිරිපත් කල නොහැකි බව අවධාරණය කරනු කැමැත්තෙමි.

සමීක්ෂණ කටයුතු පිළිබඳ විශ්වාසනීයත්වය සහතික කර ගැනීම සඳහා සමීක්ෂණ නිලධාරීන් අවශ්‍ය පරිදි දැනුවත් කිරීමටද, සුදුසු අධීක්ෂණ වැඩ පිළිවෙලක් යෙදීමටද කරුණාකර පියවර ගන්න. එහිදී මෙම කාර්යාලයේ සහාය අවශ්‍ය නම්, කල්වේලා ඇතිව මා වෙත දන්වා එවන්න.

එස්.එෆ්.පතිරණ,
ඉඩම් කොමසාරිස්.

පිටපත්:-01. දිසාපති, ත්‍රිකුණාමලය.
02. ප්‍රාදේශීය ලේකම්, ...................